# ජාතික ශිල්ප සභාව

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ තනතුර

ජාතික ශිල්ප සභාවේ පුරප්පාඩුව ඇති ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සුදුසුකම්

### බාහිර අයදුම්කරුවන්

රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන / ව්‍යාපාර කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණය / නීතිය / කළමනාකරණය පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය.

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් වාණිජ ආයතනයක කළමනාකරණ තනතුරක වසර 15 ක අවම වශයෙන් පළපුරුද්ද, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පළපුරුද්ද ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය.

සහ

කළමනාකාර සේවයේ 1 වන පන්තියේ සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-3-2006 : Rs. 41,745 - 15x1100-58,245/- (මාසික)

**වයස් සීමාව :** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයන් කෙරෙහි බලනොපානු ඇත)

ඉහත සුදුසුකම් සපුරා ඇති දීප ව්‍යාප්ත සේවාවන්හි නියුතු රාජ්‍ය නිලධාරීන් ද්විතීයික පදනම මත පත් කිරීම සලකා බලනු ඇත.

තෝරා ගනු ලබන අයදුම්කරුහට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 22/99 හි විධිවිධාන අනුව රාජකාරි හා පෞද්ගලික කටයුතු සඳහා නිල වාහනයක් හිමි වේ.

තෝරා ගනු ලබන අයදුම්කරු විසින් ජාතික ශිල්ප සභාව යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 8% කට නොඅඩු මුදලක් සේවක අර්ථ සාධක අරමුදලට ප්‍රදානය කළ යුතු වේ. ජාතික ශිල්ප සභාව විසින් 12% කට නොඅඩු මුදලක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා සාමාජික මුදල් ලෙස ගෙවනු ඇත.

ඊට අමතරව සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ජාතික ශිල්ප සභාව විසින් ගෙවනු ඇත.

අයදුම්කරුවන් විසින් සියලු විස්තර සහිතව තම අයදුම්පත් උප්පැන්න සහතිකය / අධ්‍යාපන සහතික / වෘත්තීය සහතික සහ පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් සමග බත්තරමුල්ල, ජනකලා කේන්ද්‍ර පරිශ්‍රයේ පිහිටි ජාතික ශිල්ප සභාවේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් 2015-04-30 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය"** ලෙස සටහන් කළ යුතුය.

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය අනුබද්ධිත ආයතන වල සේවයේ නියුක්ත වූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශය සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**ජනකලා කේන්ද්‍ර පරිශ්‍රය,**
**බත්තරමුල්ල**

**සභාපති,**
**ජාතික ශිල්ප සභාව**